# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

**6 ශ්‍රේණිය**

## බුද්ධ ධර්මය

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **පළමු කොටසට ලකුණු 40 කි.**
- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) සිදුහත් බෝසතාණෝ බුද්ධත්වය ලැබුවේ,

   i. පොසොන් පොහෝ දින
   ii. වෙසක් පොහෝ දින
   iii. ඇසළ පොහෝ දින
   iv. බිනර පොහෝ දින

2) බුදුරජාණන් වහන්සේ දියුණුව සඳහා උපකාරී වන කරුණු 6ක් "අත්ථස්සද්වාර" ජාතකයේ ඉදිරිපත් කර ඇත. එයින් 'අලීනතා' යනුවෙන් අදහස් කරන්නේ,

   i. ශීලාචාරකමයි
   ii. කම්මැලි නොවීමයි
   iii. දැහැමිව ජීවත්වීමයි
   iv. නීරෝගී බවයි

3) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වාචාවට අයත් වේ.

   i. කේලම් නොකීම
   ii. පරුෂ වචන නොකීම
   iii. බොරු නොකීම
   iv. ඉහත සියල්ලම

4) තමා විසින් වැරදි නොකිරීමත්, අන්‍යයින් ලවා වැරදි නොකරවීමත් අන්‍යයන් විසින් කරන වැරදි අනුමත නොකිරීමත් ඒවාට අනුබල නොදීමත් යන කරුණු වලින් යුතුව කටයුතු කිරීම අයත් වන්නේ,

   i. ආජීව අෂ්ටමක සීලයටයි
   ii. පන්සිල්වලටයි
   iii. ත්‍රිකෝටි පාරිශුද්ධ සීලයටයි
   iv. පැවිදි සීලයටයි

5) තමා ගැන සිතා අන් අයට අයහපත පිණිස හේතුවන ක්‍රියාවන්ගෙන් වැළකී, යහපත පිණිස හේතුවන ක්‍රියාවන්හි නිරතවීම හැඳින්වෙන්නේ,

   i. අනිත්‍ය ලෙසය
   ii. අනාත්ම ලෙසය
   iii. අත්තුපනායික ධර්මය ලෙසය
   iv. හේතුඵල දහම ලෙසය

6) දෙමාපියන් 'බ්‍රහ්ම' යන නාමයෙන් හැඳින්වීමට හේතුව වනුයේ,

   i. සතර බ්‍රහ්ම විහරණ වලින් යුක්ත වන නිසාය
   ii. පන්සිල් ආරක්ෂා කරන නිසාය
   iii. දරුවන්ට යහමඟ පෙන්වන නිසාය
   iv. බොහෝ කරුණාවන්ත නිසාය

7) සිල්වත්ව කටයුතු කිරීමේ ආනිසංස ගණන වන්නේ,

i. 7 කි
ii. 5 කි
iii. 10 කි
iv. 11 කි

8) බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය දේශනා කළේ,

i. මඝ තරුණයාටය
ii. සිඟාල ගෘහපතියාට
iii. රාහුල තෙරුන්ට
iv. සුමන මාලා කරුට

9) අපගේ ලොවේ හිරු සඳු ලෙස සැලකෙන්නේ,

i. ගුරුවරුන් ය
ii. වැඩිහිටියන් ය
iii. පැවිදි උතුමන් ය
iv. දෙමව්පියන් ය

10) මඝ මානවක ජීවත් වූ ග්‍රාමය වන්නේ,

i. රුහුණු ග්‍රාමය
ii. මියුලු නුවර
iii. මචල ග්‍රාමය
iv. කතරගම ග්‍රාමය

- **පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

11) ශික්ෂාකාමී භික්ෂූන් අතර අගතනතුර හිමි වූයේ රාහුල තෙරුන්ට ය. (   )
12) පරම ලාභය වන්නේ නීරෝගීකමයි. (   )
13) සියලුම ජාතීන් අතර එකමුතුකම ජාතික කොඩියේ කහ තීරුවෙන් නිරූපණය වේ. (   )
14) ජාතික කොඩිය එසවූ විගස ජාතික ගීය ගායනා කළ යුතුය. (   )
15) ලොව පවතින පණ ඇති පණ නැති සෑම දෙයකම වෙනස්වීම අනිත්‍යතාවය නොවේ. (   )

- **පහත ප්‍රශ්න වල හිස්තැන් සඳහා වඩාත් ගැළපෙන පිළිතුර, වරහන් තුළින් තෝරා ලියන්න.**

16) ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය ................................... මලයි.
17) ජාතික කොඩිය රැගෙන යාමේදී එහි යෂ්ටිය ................................... තබාගත යුතුය.
18) අභියෝග ජයගත් තරුණයින් පිරිසක් ගැන කියැවෙන්නේ ................................... ජාතක කතාවෙහිය.
19) කෙනෙකුගේ දියුණුවට ඊර්ෂ්‍යායා නොකර සතුටුවීමේ ගුණාංගය ................................... ලෙස හැඳින්වේ.
20) දරුවන් විසින් දෙමාපියන් වෙත යුතුකම් 5ක් ඉටුකළ යුතු බව ................................... සූත්‍රයේ දැක්වේ.

**( සෘජුව / නිල්මහනෙල් / මඝ මානවක / මුදිතාව / සිඟාලෝවාද සූත්‍රය )**

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළත්ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1) දෙවැනි වාරයට නියමිත 'ක්ෂණික කථාවක් ' යන මාතෘකාව යටතේ කළ ඇගයීම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

    i. මෙම ඇගයීමේදී ගුරුවරයාගෙන් ඔබට ලැබුණු උපදෙස් 2ක් ලියන්න.

    ii. ක්ෂණික කථාවාරයේදී ඔබට ලැබුණු මාතෘකාව කුමක්ද?

    iii. ක්ෂණික කථාවාරයේදී ඔබට ලැබුණු මාතෘකාව ඇතුළත් පාඩමේ නම කුමක්ද?

    iv. ඔබ ඉදිරිපත් කළ කථාවේ අඩංගු වූ කරුණු දෙකක් ලියන්න.

    v. එම ඇගයීමේදී ඔබ මුහුණ දුන් ගැටළු දෙකක් ලියන්න.

    vi. ත්‍රිකෝටි පරිශුද්ධි සීලය යනු කුමක්ද?

    vii. ශීලයේ ප්‍රභේද දෙක ලියන්න.

    viii. ඔබ විසින් සිදු කරන ලද යහපත් ක්‍රියා දෙකක් ලියන්න.

    ix. ක්ෂණික කථාවක් ඉදිරිපත් කිරීම තුළින් ඔබ ලැබූ අත්දැකීම් දෙකක් ලියන්න.

(ල. 20)

2)

    i. සිදුහත් උපතක් සමඟ සිදු වූ අසිරිමත් සිදුවීම් දෙකක් ලියන්න. (ල. 2)

    ii. පස්මහ බැලුම් අතරින් තුනක් ලියන්න. (ල. 3)

    iii. සිදුහත් බෝසතාණන් වහන්සේගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ල. 5)

3)

    i. පුද්ගලයෙකුගේ දියුණුව සඳහා ඉවහල්වන කරුණු ඇතුළත් ජාතක කථාව කුමක්ද? (ල. 2)

    ii. නීරෝගීබව රැකගැනීම සඳහා ඔබට කළ හැකි දේවල් තුනක් ලියන්න. (ල. 3)

    iii. දියුණුවේ දොරටු හය ලියා දක්වන්න. (ල. 5)

4)

    i. සිඟාලෝවාද සූත්‍රයට අනුව දෙමාපියන් දක්වා ඇති දිශාව කුමක්ද? (ල. 2)

    ii. සිව්බඹ විහරණ වලින් තුනක් ලියන්න. (ල. 3)

    iii. සිඟාලෝවාද සූත්‍රයට අනුව දරුවන් විසින් දෙමාපියන්ට ඉටු කළ යුතු යුතුකම් පහක් ලියන්න. (ල. 5)

5)

    i. කිසියම් ක්‍රියාවක හොඳ නරක හඳුනාගන්නා ආකාරය ඇතුළත් සූත්‍ර දේශනාව කුමක්ද? (ල. 2)

    ii. එම සූත්‍රයට අනුව හොඳ ක්‍රියාවක් හඳුනාගන්නා මිනුම් දඬු තුන ලියන්න. (ල. 3)

    iii. මෙම මිනුම් දඬු අනුව ඔබට සිදු කළ හැකි යහපත් ක්‍රියා පහක් ලියන්න. (ල. 5)

6)

    i. පන්සිල් සුරැකීම හා සැමට මෛත්‍රී කිරීමේ අගය පෙන්වා දෙන ජාතක කථාව කුමක්ද? (ල. 2)

    ii. මඝ මානවක ඇතුළු පිරිස සිදු කළ සමාජ සේවා අතරින් තුනක් ලියන්න. (ල. 3)

    iii. මඝ මානවක ආරක්ෂා කළ ප්‍රතිපත්ති හතෙන් පහක් ලියන්න. (ල. 5)